# පැළෑණ සිරි වජිරඥාණ දහම් පාසල - වැලිගම
# Pelena Siri Vajirañāna Dhamma School - Weligama

## ශ්‍රී බු. ව. 2566 - මධ්‍යවාර පරීක්ෂණය - 2022 දෙසැම්බර්
## 2566 B.E. - Mid Term Test - 2022 December
## 04 ශ්‍රේණිය - Grade - 04

**විභාග අංකය:-** ........................................................... **කාලය : පැය 01 යි. විනාඩි 30 යි.**

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

## I කොටස

**නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.**

01.ගුත්තිල කාව්‍ය රචනා කරන ලද්දේ,

i. රාහුල හිමි ii. වෑත්තෑවේ හිමි iii. සරණංකර හිමි

02. "සපුරා දස පෙරුම්" මෙම කවියේ ඊළඟ පදය කුමක් ද?

i. පළ කළ බුදු ව මනරම් ii. වදිමි අදරින් අනැඟි සදහම් iii. හරනා බව බිරම්

03. ධර්ම රත්නයේ ගුණ කීයද?

i. 5 ii. 6 iii. 9

04. ශාක්‍ය ජනපදයේ අගනුවර කුමක් ද?

i. සැවැත් නුවර ii. සාකේත නුවර iii. කිඹුල්වත් නුවර

05. සිදුහත් කුමරු ඉපදුණේ කුමන පොහොය දවසේ ද?

i. වෙසක් පොහොය ii. පොසොන් පොහොය iii. ඇසළ පොහොය

06. ඍද්ධිමතුන් අතරින් අගතැන්පත් මහරහතන් වහන්සේ වූයේ

i. රාහුල මහරහතන් වහන්සේ
ii. මුගලන් මහරහතන් වහන්සේ
iii. සැරියුත් මහරහත්න් වහන්සේ

07. බුදුන් වහන්සේගේ ධර්මය පළමුවරට කොලිත උපතිස්ස දෙදෙනාට දේශනා කළේ කවුරුන් ද?

i. අස්සජි හිමි ii. කොණ්ඩඤ්ඤ හිමි iii. සංජය පිරිවැජියා

08. පන්සලට ගොස් පළමුව වන්දනා කරනු ලබන්නේ

i. වෙහෙර වහන්සේ ii. බිදු පිළිම වහන්සේ iii. බෝධීන් වහන්සේ

09. තෙරුවන් යනුවෙන් හඳුන්වන්නේ

i. ශීල , සමාධි ,ප්‍රඥා ii. බුද්ධ , ධම්ම , සංඝ iii. සිත , කය , වචනය

10. මහාමායා දේවිය කලුරිය කළේ සිදුහත් කුමරු ඉපදී දින කීයකින් ද?

i. දින 5 ii. දින 14 iii. දින 7

11. "සිය පින් සිරින් සරු" කවියට අනුව බුදුරජාණන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණ කොපමණ ද?

i. 35 ii. 32 iii. 40

12. දහම් ගුණ වන්දනා කරනුයේ කුමන ගථාව මගින් ද?

i. ඉතිපිසෝ භගවා අරහං...

ii. ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ...

iii. සුපටිපන්නෝ භගවතෝ...

13. මහාමායා දේවියගේ දෙමාපියන් ජීවත් වූයේ

i. කිඹුල්වත් පුරය ii. සැවැත් නුවර iii. දෙව්දහ නුවර

14. සිදුහත් කුමරුට ශිල්ප ශාස්ත්‍රය ඉගැන්වූයේ කවුද?

i. සර්වමිත්‍ර බමුණා ii. කොණ්ඩඤ්ඤ iii. අසිත තවුසා

15. සිදුහත් කුමරුගේ සුළු මව කවුරුන් ද?

i. යශෝදරා දේවිය ii. ඛේමා බිසව iii. මහා ප්‍රජාපතී ගෝතමී දේවිය

**( ලකුණු - 15 )**

## II කොටස

01.

I. සුද්ධෝදන රජුගේ ගුරුවරයා කවුරුන්ද?
II. වෙසක් පෝයදා සිදු වු විශේෂ සිදුවීම් 3 කුමක්ද?
III. මහාමායා දේවිය දුටු සිහිනය කුමක්ද?
IV. සිදුහත් කුමරු උගත් ශිල්ප මොනවාද?
V. භාවනා කිරීමේදී ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් වාඩි වන ආකාරය වෙන් වෙන්ව ලියා දක්වන්න.

**(ලකුණු - 05)**

02.

I. පන්සලට යන විට රැගෙන යන දේවල් මොනවාද?
II. ත්‍රිවිධ චෛත්‍ය නම් කරන්න.
III. මල් පූජා කරන ගාථාව කුමක්ද?
IV. මෙම වචනවල තේරුම ඔබේ වචනයෙන් ලියා දක්වන්න.
1. පැන්
2. අත් ධෝවනය කිරීම
3. අමදිනව

**(ලකුණු - 10)**

03.

I. මෛත්‍රී භාවනාව යනු කුමක්ද?
II. මෛත්‍රී භාවනාව වැඩීමෙන් අපට ඇති ප්‍රයෝජන මොනවාද?
III. "මාතා යථා නියං පුත්තං" යන ගාථාව සම්පූර්ණ කරන්න.

**(ලකුණු - 10)**

04.

I. බුදුරජාණන් වහන්සේ මහියංගනයට වැඩම කළේ කුමන පොහොය දවසේද?
II. බෞද්ධ පෙරහැරක තිබිය යුතු මූලික අංග මොනවාද?
III. උත්සව අවස්ථාවකදී පන්සලේ සැරසිලි කරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

**(ලකුණු - 10)**

05.

I. අංජන ශාක්‍ය වංශිකයාගේ දියණිවරු දෙදෙනා කවුරුන්ද?
II. ප්‍රජාපතී ගෝතමී දේවියගේ පුත් කුමරු සහ මුණුබුරා කවුරුන්ද?
III. බුද්ධ මාතාව යන ගරු නාමයෙන් සම්මාන ලැබුවේ කවුරුන් ද?

IV. ප්‍රජාපතී ගෝතමී දේවියගේ චරිතයෙන්ගත හැකි උතුම් ගුණාංගය මොනවාද?

(ලකුණු - 10)

06.

I. සැරියුත් සහ මුගලන් යන මහ රහතන් වහන්සේලා දෙදෙනාගේ ගිහි නම් කරන්න.

II. රජගහ නුවර වසරක් පාසා පැවැත්වෙන සැණකෙළිය කුමක්ද?

III. "යේ ධම්මා හේතුප්පභවා" යන ගාථාව සම්පූර්ණ කරන්න.

(ලකුණු - 10)

07.

I. උප මහා බෝසතාණන් වහන්සේට බුදුබව ලැබීමේදී සෙවණ ලබා දුන් බෝධිය කුමක්ද?

II. "යස්ස මූලේ නිසින්නෝව" යන ගාථාව සම්පූර්ණ කරන්න.

III. බුදුරජාණන් වහන්සේ බුදු බව ලැබීමට උපකාරී වු බෝධීන් වහන්සේට කළගුණ සුලකීමක් වශයෙන් කළේ කුමක්ද?

IV. "සබ්බේ තසන්ති දණ්ඩස්ස" යන ගාථාව සම්පූර්ණ කරන්න.

(ලකුණු - 10)

08.

I. ලෝවැඩ සඟරාව රචනා කළේ කවුරුන් විසින්ද?

II. ආනාපානසති භාවනාව යනු කුමක්ද?

III. ආනාපානසති භාවනාව වැඩීමෙන් ඇති ප්‍රයෝජන මොනවාද?

(ලකුණු - 10)

09.

I. ගන්ධාර දේශයේ තක්ෂිලා නුවර සිටි වසු පැටියා කවුරුන්ද?

II. එම ගවයා පළමු වර ගැල් සියය නොයැද සිටියේ කුමක් නිසාද?

III. එම ජාතක කතාවෙන් අපට ලබා ගත හැකි ප්‍රධාන ආදර්ශය කුමක්ද?

IV. "අභිවාදන සීලිස්ස" යන ගාථාව සම්පූර්ණ කරන්න.

(ලකුණු - 10)